Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**08 ශ්‍රේණිය**

# පුරවැසි අධ්‍යාපනය

**කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **ප්‍රශ්න අංක 01- 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. පොදු සේවා සැපයීමේ අවශ්‍යතාව තවදුරටත් වර්ධනය කිරීම අවශ්‍ය වී තිබෙන්නේ .................................................................... නිසාය.
(ප්‍රමාණවත් ආදායමක් නොලැබීම / අවශ්‍යතා සංකීර්ණ වීම / කාර්මික දියුණුව)

02. පුද්ගල සංවර්ධනය තුළින් ......................................................... ට දායක වීම පොදු සේවාවල ලක්ෂණයකි.
(මහජන සුභසිද්ධිය / සමාජ සංවර්ධනය / තාක්ෂණික දියුණුව)

03. සුව දිවි මධ්‍යස්ථාන ....................................................... රෝග වැළැක්වීම අරමුණු කරගෙන පිහිටුවා ඇත.
(බෝවන රෝග / ළදරු හා මාතෘ / බෝ නොවන රෝග)

04. ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයක ..................................................... හා මනු කියවන්නන් සහිත කාර්ය මණ්ඩලයක් ඇත.
(ක්ෂේත්‍ර සේවකයන් / වැඩ මූලික / ඩිපෝ කළමනාකරු)

05 ජනතා අදහස් හා පැමිණිලි ආදිය වගකිවයුතු අංශ වෙත යොමු කිරීමට .............................................. සේවාව දායකත්වය සපයයි.
(ආරක්ෂක / ප්‍රවාහන / සන්නිවේදන)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06 කොහු හා පේෂකර්ම නිෂ්පාදන අලෙවිය සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති කර්මාන්ත සමුපකාර සමිති වැදගත් ය. ( )

07 සැමට සෙවණ වැඩසටහන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහනකි. ( )

08 ජාතික අවශ්‍යතාවයන්ට ගැලපෙන පුරවැසියන් බිහිකිරීමේ කාර්යය අධ්‍යාපන සේවාව සතු විශාල වගකිමකි. ( )

09 පරිසර නීතිරීති ක්‍රියාත්මක කිරීමට හා කඩවන අවස්ථාවලදී මධ්‍යම පරිසර අධිකාරිය සහාය ලබාදෙයි. ( )

10 තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් අයිතිවාසිකම් ඉටුකිරීම පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි. ( )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ළමා අයිතිවාසිකම් ආශ්‍රිත ප්‍රධාන තේමාවක් වන්නේ මින් කුමක් ද?

(1) පෝෂණය ලැබීමේ අයිතිය (2) දරුවන් රැකබලා ගැනීමේ අයිතිය

(3) ආරක්ෂාවට ඇති අයිතිය (4) ජීවත්වීමේ අයිතිය

12 දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටලු විමර්ශනය හා සහාය ලබාදීමට අවශ්‍ය සේවා සපයන රාජ්‍ය නිලධාරී වන්නේ මින් කවරෙක් ද?

(1) මුල් ළමාවිය සංවර්ධන නිලධාරී (2) ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී

(3) සමාජ සේවා නිලධාරී (4) ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී

13 සමාජයේ ඇතැම් පුද්ගලයින් බොහෝවිට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම හා සිය දිවි නසාගැනීම්වලට යොමුවන්නේ මින් කවර කරුණක් නිසාද?

(1) කායිකව පිරිහීම.

(2) චිත්තවේගවලට බාහිරව දක්වන ප්‍රතික්‍රියා අධික වීම.

(3) කෝපය හා දුක නිසා එයට ප්‍රතික්‍රියා දැක්වීම.

(4) අයහපත් චිත්තවේග තත්වයන් දිගින් දිගටම පැවතීම.

14 සිසුන්ට ඇතිවන අයහපත් චිත්තවේගයන් සමනය සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 2 ක් අඩංගු වන්නේ මින් කවර පිළිතුරේ ද?

(1) පෙර සූදානම හා නීතිරීති පිළිපැදීම.

(2) ඇවිදීම හා සවන්දීම.

(3) සුරතල් සතුන් ඇතිකිරීම හා පරිසරය රසවිඳීම.

(4) අන් අයගේ උපදෙස් ලබාගැනීම හා ගීත ගායනය.

15 සමාජයට නායකයෙකු අවශ්‍ය වන්නේ මින් කවර කරුණු නිසාද?

(1) ඉලක්ක කරා මෙහෙයවීමට හා ගැටලු විසඳා ගැනීමට

(2) ගැටලු අවම කිරීමට හා මිත්‍රශීලී බව ගොඩනැගීමට

(3) නියමිත පරිදි සැලසුම් කිරීමට හා අන් අයට උදව් කිරීමට

(4) පක්ෂග්‍රාහී නොවීමට හා ස්ථිරසාර බවට

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන නිවැරදි පිළිතුර හිස්තැන මත ලියා දක්වන්න.**

16 නායකයා කණ්ඩායම මෙහෙයවන අතර ................................................ නායකත්වයට අනුව කටයුතු කරයි.

17 එකිනෙකා පිළිගැනීම හා ගෞරව කිරීම ................................................ ජන සමාජයක් බිහිකිරීමට හේතුවේ.

18 බහු සංස්කෘතික සමාජයක ජීවත්වන සෑම පුද්ගලයකුම ........................................................ හා සාමූහිකත්වයෙන් කටයුතු කළ යුතුය.

19 සංස්කෘතික අංග ආරක්ෂා කරමින් පවත්වාගෙන යාමෙන් සංස්කෘතියේ ................................................ හා අභිමානය ප්‍රදර්ශනය වේ.

20 මහා ශිව රාත්‍රී උත්සවය .................................................................. භක්තිකයන්ගේ සංස්කෘතික උත්සවයකි.

(ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01


A


B


C


D

(1) ඉහත රූප සටහන් හතර මගින් දැක්වෙන අප ප්‍රයෝජනයට ගන්නා සේවාවන් නම් කරන්න.

A - .................................... B - ....................................

C - .................................... D - .................................... (ල. 04)

(2) එම සේවාවන් ආශ්‍රිත කාර්ය මණ්ඩලය එක් අයෙකු බැගින් සඳහන් කරන්න.

A - .................................... B - ....................................

C - .................................... D - .................................... (ල. 04)

(3) A හා B සේවාවන් භුක්ති විඳීමේ දී පුරවැසියන් විසින් ඉටුකළ යුතු යුතුකම් දෙක බැගින් ලියන්න.

A i. .................................... ii. ....................................

B i. .................................... ii. .................................... (ල. 04)

(4) C හා D සේවාවන් සපයන ආයතන වලින් ඉටුවිය යුතු යුතුකම් දෙක බැගින් ලියා දක්වන්න.

C i. .................................... ii. ....................................

D i. .................................... ii. .................................... (ල. 04)

02 (i) ඔබේ පවුලේ සාමාන්‍ය කටයුතුවලදී සියලු දෙනා එක්ව සාකච්ඡා කර තීරණ ගන්නා අවස්ථා දෙකක් ලියන්න. (ල. 02)

(ii) පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ල. 03)

(iii) පාසල ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් ලෙස ඔබ සැලකීමට හේතු තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iv) ප්‍රජාතන්ත්‍රවාදී දිවිපැවැත්මට අදාළ ගුණාංග තුනක් සඳහන් කරන්න. (ල. 03)

03

(i) ඉහත රූපයෙන් දැක්වෙන ළමා අයිතිවාසිකම් සුරැකීමට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ආයතනය කුමක් ද? (ල. 02)

(ii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රටතුළ ක්‍රියාත්මක වන ආයතන දෙකක් නම් කරන්න. (ල. 02)

(iii) පහත දී ඇති ළමා අයිතිවාසිකම්වලට අදාළව ළමයෙකු ලෙස ඔබ ඉටුකළ යුතු යුතුකම් එක බැගින් සඳහන් කරන්න.

1. අධ්‍යාපනය ලැබීම
2. සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම
3. ආගමික විශ්වාසයන් දැරීමේ නිදහස
4. නිදහස් අදහස් ප්‍රකාශ කිරීම (ල. 04)

(iv) ළමයෙකු වශයෙන් ඔබට ඇතිවිය හැකි ගැටළු කිහිපයක් පහත දක්වා ඇත. ඒ සම්බන්ධව ඔබට සේවා ලබාගතහැකි රාජ්‍ය නිළධාරීන් දක්වන්න.

1. පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධ ගැටළු
2. පාසල් නොයෙන දරුවන් පාසල් ගත කිරීම
3. ආර්ථික අපහසුතා ඇති දරුවන්ට විශේෂ සමාජ සුභසාධන සේවා සැපයීම (ල. 03)

04 (i) පහත රූප සටහනේ දැක්වෙන චිත්තවේග හඳුනාගෙන නම් කරන්න. (ල. 04)



A B C D

(ii) එවැනි අවස්ථාවන්හිදී ඔබ දක්වන ප්‍රතික්‍රියා බැගින් සඳහන් කරන්න.

A - .................................... B - ....................................

C - .................................... D - .................................... (ල. 04)

(iii) ඔබට අයහපත් චිත්තවේග ඇතිවූ අවස්ථාවකදී එය සමනය සඳහා ඔබ විසින් ගන්නා ක්‍රියාමාර්ග තුනක් ලියා දක්වන්න. (ල. 03)

05 (i)



A B C

ඉහත එක් එක් ආයතන හා අවස්ථා තුළදී නායකත්වය දරන පුද්ගලයින් ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 03)

A < ...............................................
  සහකාර විදුහල්පති

B < වැඩිහිටි දරුවන්
  ...............................................

C < දේශපාලන නායකයින්
  ...............................................

(ii) පාසල තුළ ඔබ නායකයෙකු ලෙස ගොඩනැගීම සඳහා ඔබ තුළ ඇතිකරගතයුතු ගුණාංග එක බැගින් පහත ක්ෂේත්‍ර ඔස්සේ හඳුනාගෙන නම් කරන්න.

1. සන්නිවේදන හැකියාව
2. සැලසුම් කිරීමේ හැකියාව
3. මානව සබඳතා (ල. 03)

(iii) සමාජයේ ඔබට දක්නට ලැබෙන නායකත්ව ශෛලීන් දෙකක් නම් කරන්න. (ල. 02)

(iv) රටක සමාජය සඳහා නායකත්වයක් අවශ්‍ය වීමට හේතු තුනක් සඳහන් කරන්න. (ල. 03)

06 (i) ශ්‍රී ලංකාව හැර වෙනත් බහු සංස්කෘතික සමාජ පවතින රටවල් තුනක් ලියා දක්වන්න. (ල. 03)

(ii) ශ්‍රී ලාංකික බහු සංස්කෘතික සමාජයේ ඔබට දක්නට ලැබෙන ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 04)

(iii) බහු සංස්කෘතික සමාජයක් පවතින රටවල් ආශ්‍රිත ලක්ෂණ කීපයක් පහත දක්වා ඇත. එම ලක්ෂණ අනුව එම සමාජය අයත් රට නම් කරන්න.


A හින්දි හා ඉංග්‍රීසි භාෂා රාජ්‍ය භාෂා ලෙස කථා කිරීම.

B කිසිම ආගමක් රාජ්‍ය ආගම ලෙස නොපිළි ගැනීම.

C සෑම පුරවැසියෙකුම රාජ්‍ය භාෂාවට අමතරව වෙනත් භාෂාවක් දැන සිටීම.

D ආගම මුල්කරගෙන ප්‍රධාන සංස්කෘතීන් හැඩගැසී ඇත. (ල. 04)

07 පහත උපකාරක පද උපයෝගී කරගෙන ඉහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




හරහට

1. විෂය සමගාමී ක්‍රියාකාරකමකි.

4. භාවනාව මගින් මෙය සන්සුන් වේ.

5. සැමවිටම ..................................... පුරවැසියකු ලෙස කටයුතු කිරීමෙන් තිරසාර සංවර්ධනයට දායක විය හැකිය.

6. මෙයට ගරුකිරීම පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි.

10. හැඬීම, විලාපදීම, සුසුම්හෙළීම වැනි ප්‍රතික්‍රියා දක්නට ලැබෙන්නේ මෙම චිත්තවේගී තත්වය තුළය.

පහළට

2. මෙම පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම නියගයෙන් ආරක්ෂාවීමට ගතහැකි එක් ක්‍රියාමාර්ගයකි.

3. ඉස්ලාම් භක්තිකයන්ගේ ශුද්ධ භූමිය ලෙස හැඳින්වේ.

7. පවුල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයකි.

8. අධ්‍යාපනය තුළින් මෙය පෝෂණය කරයි.

9. නියගය නිසා මෙම බිම් විනාශ වේ.

11. පොදු සේවාවකි. (ල. 11)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2019**

**08 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

**I කොටස**

01. අවශ්‍යතා සංකීර්ණ වීම 02. සමාජ සංවර්ධනය 03. බෝනොවන රෝග
04. ක්ෂේත්‍ර සේවකයන් 05. සන්නිවේදනය 06. ✓ 07. ✓ 08. ✓ 09. ×
10. × 11 3 12 2 13 4 14 3 15 1 16 අනුගාමිකයා
17 නීතිගරුක 18 අන්‍යෝන්‍ය විශ්වාසය 19 පෞරුෂත්වය 20 හින්දු

(2 x 20 = 40)

**II කොටස**

01. (1) A සෞඛ්‍ය B අධ්‍යාපනය C ආරක්ෂක සේවය D ප්‍රවාහන සේවය
(2) A වෛද්‍යවරයා, හෙදිය B ගුරුවරයා, විදුහල්පති
C යුධ හමුදා නිලධාරී / පොලිස් නිලධාරී D රියදුරු, කොන්දොස්තර ආදී
(3) A වෛද්‍ය උපදෙස් පිළිපැදීම / නොමිලේ ලබාදෙන ඖෂධ අපතේ නොයැවීම
B මැනවින් ඉගෙනීමේ කටයුතුවල නියැළීම / ගුරු ගෞරවය රැකෙන පරිදි කටයුතු කිරීම (පිටුව 30 හා 31)
(4) C මහජන ආරක්ෂාව සහතික කිරීම / සමාජ විරෝධී ක්‍රියා මැඩලීම
D කාර්යක්ෂම ලෙස සේවා සැපයීම / මගී ආරක්ෂාව සහතික කිරීම (පිටුව 28, 29)

02. (i) ආහාරවේල් තෝරාගැනීම / නිවස පිරිසිදුව තබාගැනීම (පිටුව 36)
(ii) සාකච්ඡා මගින් තීරණවලට එළඹීම / සාමකාමීව ගැටලු නිරාකරණය කර ගැනීම (පිටුව 35)
(iii) නායකත්වයට ගරු කිරීම / සහයෝගයෙන් කටයුතු කිරීම (පිටුව 38)
(iv) අන් මතයට ගරු කිරීම / විවිධ මත ඉවසීම (පිටුව 51)

03 (ii) එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල (යුනිසෙෆ්)
(ii) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ළමා හා කාන්තා කාර්යාංශය, ශ්‍රී ලංකා පොලීසිය
(iii) 1. හොඳින් අධ්‍යාපන කටයුතුවල නිරතවීම. 2. පෞද්ගලික සෞඛ්‍ය පිළිබඳ දැනුවත්වීම.
3. ආගමානුකූල හා යහපත් දිවිපැවැත්ම. 4. සත්‍ය කරුණු ප්‍රකාශ කිරීම ආදී (පිටුව 40)
(iv) 1. මුල් ළමාවිය සංවර්ධන නිලධාරී
2. නොවිධිමත් අධ්‍යාපනය හා විධිමත් අධ්‍යාපනය පිළිබඳ නිලධාරී
3. සමාජ සේවා නිලධාරී

04 (i) A සතුට B දුක C කෝපය D බිය
(ii) A සිනාසීම, නැටීම B හැඬීම, විලාප දීම C බැණ වැදීම, වචන පැටලීම
D ගොතගැසීම, ඇස් විශාල වීම (පිටුව 43)
(iii) පිටු අංක 44 දක්වා ඇති ඕනෑම ක්‍රියාකාරකම් 3 ක්

05 (i) A විදුහල්පති / අංශ ප්‍රධානි B දෙමාපියන්, මව, පියා
C ප්‍රජා නායකයින් / ආගමික නායකයින් (පිටුව 46)
(ii) 1. ඉදිරිපත් කිරීම / පැහැදිලි කිරීම / කථනය / සවන්දීම
2. අරමුණු තීරණය කිරීම, සැලසුම් කිරීම / තීරණ ගැනීම
3. සමාජශීලී බව, ආකර්ශණීය බව, තේරුම් ගැනීම (පිටුව 47)
(iii) ඒකාධිපති, දූෂිත නායකත්ව, නාමික නායකත්ව, ප්‍රජාතන්ත්‍රවාදී
(iv) ගැටලු විසඳා දීමට හා අවම කිරීමට
අනුගාමිකයින් උනන්දු කරවීමට ආදී (පිටුව 48)

06 (i) ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය
(ii) * විවිධ ජන වර්ග ජීවත්වීම - සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්
* විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වීම - බෞද්ධ, ඉස්ලාම්, හින්දු, කතෝලික
* විවිධ භාෂා කතාකරන ජන කොටස් ජීවත්වීම - සිංහල, දෙමළ
* විවිධ සිරිත් විරිත් දක්නට ලැබීම.
* විවිධ සංස්කෘතික උරුම පැවතීම
(iii) A ඉන්දියාව B ඇමරිකා එක්සත් ජනපදය
C ඉන්දියාව D ශ්‍රී ලංකාව

07 <u>හරහට</u>
1. බාලදක්ෂ 4. මනස 5. යහපත් 6. නායකත්වය 10. දුක
<u>පහළට</u>
2. ජල 3. මක්කම 7. සමානාත්මතාව 8. ජාතික සමගිය 9. වගා
11. විදුලිය